ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

# පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය I | කාලය පැය 01 යි |
|---|---|---|

සැලකිය යුතුයි :

- **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) , (2) , (3) , (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.**
- **ඔබට සපයන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.**

---

(01) වර්තමානයේ ශ්‍රී ලංකාව ඇතුළු ලෝකයේ බොහෝ රටවල දක්නට ලැබෙන පාලන ක්‍රමය වනුයේ ,

(1) රාජාණ්ඩු පාලන ක්‍රමය (2) රදළ ආණ්ඩු ක්‍රමය
(3) සමාජවාදී පාලන ක්‍රමය (4) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය

(02) පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේ දී මතු වූ ගැටලුවක් නොවන්නේ,

(1) වර්තමාන රාජ්‍ය භූමි ප්‍රමාණයෙන් විශාල වීම. (2) වර්තමාන රාජ්‍යවල ජනගහනය අධික නොවීම.
(3) සියලු දෙනාට එක් ස්ථානයකට රැස් වීමේ අපහසුව (4) සමාජ අවශ්‍යතා සංකීර්ණ වීම.

(03) "බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව නිදහසයි" යනුවෙන් ප්‍රකාශ කර ඇත්තේ,

(1) ඒබ්‍රහම් ලින්කන් මහතා (2) සීලර් මහතා
(3) G.D.H.කෝල් මහතා (4) A.V.ඩයිසි මහතා

(04) ජාතික රාජ්‍ය බිහි වීමට බලපෑම් නොකළ සාධකයකි.

(1) රෙපරමාදු ආගමික ප්‍රතිසංස්කරණ (2) වැඩවසම් ක්‍රමයේ නැගී ඒම
(3) පුනරුදය (4) විද්‍යාත්මක දැනුම වර්ධනය වීම

(05) බහු සංස්කෘතික භාවය හොඳින් ප්‍රයෝජනයට ගෙන "වෙනස්කම් තුළින් එකමුතු බව" යන තේමාව මත ගොඩනැගුණු රාජ්‍යයන් දෙකක් වනුයේ,

(1) ඇමරිකාව , ජපානය (2) සිංගප්පූරුව - ඇමරිකාව
(3) ස්විට්සර්ලන්තය - ජපානය (4) සිංගප්පූරුව - ස්විට්සර්ලන්තය

(06) බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංගයකි.

(1) අන්‍ය ආගම් වලට අවමන් නොකිරීම. (2) මාධ්‍ය නිදහස ආරක්ෂා කිරීම.
(3) විනිවිදභාවයෙන් කටයුතු කිරීම. (4) අයිතිවාසිකම් සුරැකීම.

(07) රටක ආර්ථික සංවර්ධනය මන්දගාමී වීමට හා සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපා ඇති සාධකයක් නොවන්නේ මින් කවරක් ද ?

(1) අනවශ්‍ය ආකාරයෙන් බලය විමධ්‍යගත වීම.
(2) රාජ්‍යය සේවය දේශපාලනීකරණය වීම.
(3) අල්ලස් හා දූෂණය ඉහළ යාම.
(4) පෞද්ගලික අංශය ජාතික අභිලාෂ සලකා කටයුතු කිරීම.

(08) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික රටක් වීමට බලපෑ සාධකයක් ලෙස අතීත ආක්‍රමණ පෙන්වා දිය හැකිය.මේ අතරින් ආක්‍රමණික කණ්ඩායමක් වනුයේ,

(1) විජය ඇතුළු පිරිසගේ පැමිණීම. (2) පඬුවස්දෙව් ඇතුළු පිරිසගේ පැමිණීම.
(3) පණ්ඩු පාරින්ද ඇතුළු පිරිසගේ පැමිණීම. (4) මිහිඳු හිමියන් ඇතුළු පිරිසගේ පැමිණීම

(09) රුවන්ඩාවේ ටුට්සිවරු හා හුටුවරු අතර ඇති වූ ගැටුම් අයත් වන්නේ,

(1) වාර්ගික ගැටුම් වලටය
(2) දේශපාලන ගැටුම් වලටය
(3) ආගමික ගැටුම් වලටය
(4) සමාජ ආර්ථික ගැටුම් වලටය

(10) ගැටුම් නිරාකරණයේ දී පවුල් ආරවුල් නිරාකරණය සඳහා යොදාගත හැකි ගැටුම් නිරාකරණ ක්‍රමය වනුයේ,

(1) සාකච්ඡා ක්‍රමය
(2) මැදිහත්කරණය
(3) සමථකරණය
(4) ඉහත සියල්ලම

(11) වාර්ගික , ආගමික , කුල , ගෝත්‍ර අතර විවිධ පරස්පරතා හා මතභේද නිසා ඇතිවන ගැටුම්,

(1) පුද්ගල කණ්ඩායම් අතර ඇතිවන ගැටුම් වේ
(2) රාජ්‍යයක් තුළ ඇතිවන ගැටුම් වේ
(3) රාජ්‍ය දෙකක් අතර ඇතිවන ගැටුම් වේ
(4) රටවල් කිහිපයක් අතර ඇතිවන ගැටුම් වේ

(12) ඉවසීම , සංවේදී බව , අවිහිංසක බව හා මුදිතාව අයත් වන්නේ,

(1) පුද්ගල ගුණාංග වලටය
(2) පුද්ගලයා තුළ පැවතිය යුතු සමාජයීය ගුණාංග වලටය
(3) මැදිහත්කරුවකු තුළ පැවතිය යුතු ගුණාංග වලටය
(4) සමථ කරුවෙකු තුළ පැවතිය යුතු ගුණාංග වලටය

(13) කොළඹ , යාපනය , ගාල්ල යනුවෙන් ප්‍රධාන අධිකරණ දිස්ත්‍රික්ක තුනක් දක්නට ලැබුණේ,

(1) පෘතුගීසි පාලන යුගයේදී
(2) ලන්දේසි පාලන යුගයේදී
(3) ඉංග්‍රීසි පාලන යුගයේදී
(4) නිදහසින් පසු මෙරට පාලන සමයේදී

(14) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හා අධිකරණ සංවිධාන පනත ට අනුව ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන ඉහලම අධිකරණ ආයතනය වනුයේ,

(1) අභියාචනාධිකරණය යි
(2) ශ්‍රේෂ්ඨාධිකරණය යි
(3) පළාත්බද මහාධිකරණය යි
(4) මහාධිකරණය යි

(15) රටක සාමදාන විනිශ්චකරුවන් පත් කිරීමේ බලය හිමි වන්නේ,

(1) අධිකරණ ඇමතිතුමාට ය
(2) අග්‍රවිනිශ්චකාරතුමාට ය
(3) නීතිපතිතුමාට ය
(4) ජනාධිපතිතුමාට ය

(16) අධිකරණ ආයතන වෙත නොයා ආරවුල් විසදා ගැනීමට හඳුන්වා දී ඇති විකල්ප ක්‍රමය නිවැරදිව දක්වා ඇත්තේ,

(1) බේරුම්කරණය
(2) ඔම්බුඩ්ස්මන්වරයා
(3) මානව හිමිකම් කොමිසම
(4) ඉහත සියල්ලම

(17) සුළු ජාතික අයිතිවාසිකම් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ ආණ්ඩුක්‍රමයකි,

(1) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය
(2) සෝල්බරි ආණ්ඩු ක්‍රමය
(3) ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(4) දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

(18) ශ්‍රී ලංකාවේ බලය බෙදීම පිළිබඳ ව දක්වා ඇති නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) 1930 ඩොනමෝර් කොමිෂන් සභා වාර්තාව
(2) 1975 රට සභා පනත
(3) 1965 දිස්ත්‍රික් සභා පනත
(4) 1983 දිස්ත්‍රික් සංවර්ධන සභා පිහිටුවීම

(19) වේවැල්කැටිය සෙල්ලිපියේ සඳහන් වනුයේ,
(1) දසගම් පාලනය පිළිබඳවයි.
(2) ගම්සභා පාලනය පිළිබඳවයි.
(3) මහනුවර රාජධානියේ රට බෙදා තිබූ අයුරු දැක්වීමයි.
(4) ගමික , පරුමක හා ගම් භෝජක ලෙස නායකයින් නම් කිරීමයි.

(20) ක්‍රි.ව.2015 වන විට එකදු නගර සභාවක්වත් ස්ථාපිත නොවූ පළාත වන්නේ,
(1) සබරගමු පළාත (2) දකුණු පළාත (3) නැගෙනහිර පළාත (4) උතුරු මැද පළාත

(21) ස්විට්සර්ලන්තයේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු හඳුන්වනු ලබන්නේ,
(1) පළාත් ලෙසය (2) පළාත් සභා ලෙසය
(3) කැන්ටන් ලෙසය (4) ප්‍රාන්ත රාජ්‍යය ලෙසය

(22) පහත සඳහන් රාජ්‍යයන් අතුරින් ඒකීය රාජ්‍ය පමණක් දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) ශ්‍රී ලංකාව , බ්‍රිතාන්‍ය (2) බ්‍රිතාන්‍ය , ඇමරිකාව
(3) ප්‍රංශය , ස්විට්සර්ලන්තය (4) ස්විට්සර්ලන්තය , ඇමෙරිකාව

(23) පළාත් සභාවක ආයතනික ව්‍යුහයේ ඉහළින්ම සිටිනුයේ,
(1) ආණ්ඩුකාරවරයා (2) ආණ්ඩුකාර ලේකම් වරයා
(3) මහ ඇමතිවරයා (4) අමාත්‍ය මණ්ඩලය

(24) ස්විට්සර්ලන්ත සන්ධීය ක්‍රමය තුළ මධ්‍යම ආණ්ඩුව සතු බලතලයක් වන්නේ මින් කුමක් ද?
(1) පුවත්පත් පාලනය (2) අධ්‍යාපනය හා උසස් අධ්‍යාපනය
(3) පණිවුඩ හුවමාරුව , තැපැල් හා විදුලි සංදේශන (4) බැංකු කටයුතු

(25) නිෂ්පාදන සාධක හා ඒවාට කරන ගෙවීම් නිවැරදිව දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) භූමිය - ලාභ (2) ශ්‍රමය - බදු මුදල්
(3) ප්‍රාග්ධනය - පොළී (4) ව්‍යවසායකත්වය - වැටුප්

(26) වී නිෂ්පාදනය සඳහා යොදා ගන්නා පොහොර හා ගෘහ භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගන්නා දැව අයත් වන්නේ,
(1) පාරිභෝගික භාණ්ඩ (2) අන්තර් භාණ්ඩ (3) ප්‍රාග්ධන භාණ්ඩ (4) ආර්ථික භාණ්ඩ

(27) තරඟකාරී වෙළඳපොළක් පැවතීම , ආදායම් අසමාන ලෙස බෙදී යාම දක්නට ලැබෙන අර්ථ ක්‍රමය වන්නේ,
(1) ධනවාදී අර්ථ ක්‍රමය (2) සමාජවාදී අර්ථ ක්‍රමය
(3) ප්‍රජාතන්ත්‍රවාදී අර්ථ ක්‍රමය (4) මිශ්‍ර අර්ථ ක්‍රමය

(28) නිදහස් වෙළඳාම පදනම් කරගෙන ඇමරිකාව , කැනඩාව, මෙක්සිකෝව එක්ව ගොඩනගන ලද සංවිධානය වනුයේ,
(1) EU සංවිධානය (2) NAFTA සංවිධානය
(3) SAPTA සංවිධානය (3) BIMSTEC සංවිධානය

(29) ආරක්ෂාව , පැවැත්ම , සංවර්ධනය හා සහභාගිත්වය යන විශේෂ අරමුණු හතර පදනම් කරගෙන බිහි වූ අයිතිවාසිකම් වනුයේ,
(1) මානව අයිතිවාසිකම් (2) ළමා අයිතිවාසිකම්
(3) කාන්තා අයිතිවාසිකම් (4) කම්කරු අයිතිවාසිකම්

(30) 'වධ හිංසාවලට හෝ කෲර , අමානුෂික , අවමන් සහගත සැලකිල්ලකට නැතහොත් දඬුවමට යටත් නොකළ යුත්තේ ය.' යනුවෙන් දක්වා ඇත්තේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ,
(1) 10 වන ව්‍යවස්ථාවේය (2) 11 වන ව්‍යවස්ථාවේය
(3) 12 වන ව්‍යවස්ථාවේය (4) 13 වන ව්‍යවස්ථාවේය

(31) අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත්වන ඓතිහාසික අවස්ථා කිහිපයක් පහත දැක්වේ. ඒ අතර සඳහන් වැරදි ප්‍රකාශය තෝරන්න.

(1) ක්‍රි.ව. 1215 බ්‍රිතාන්‍යයේ මැග්නා කාර්ටා ගිවිසුම (2) ක්‍රි.ව. 1689 බ්‍රිතාන්‍යයේ අයිතිවාසිකම් පිළිබඳ පනත
(3) ක්‍රි.ව. 1776 ඇමරිකානු නිදහස් ප්‍රකාශනය (4) ක්‍රි.ව. 1789 රුසියානු විප්ලවය

(32) එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් 1948 දෙසැම්බර් මස 10 වන දින සම්මත කර ගන්නා ලද්දේ,

(1) මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය
(2) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය
(3) ආර්ථික , සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය
(4) සීඩෝ (CEDAW) සම්මුතිය

(33) මිනිස් වර්ගයාගේ මෙන්ම ලෝකයේද යහපැවැත්ම සඳහා බලපාන පරිසර පද්ධතියකට අයත් නොවන පිළිතුර වන්නේ,

(1) කාබන් චක්‍රය (2) ජල චක්‍රය (3) ඛනිජ ලවණ (4) ආහාර ජාල

(34) ජලය දූෂණය වන ස්වාභාවික ක්‍රම වනුයේ,

(1) කර්මාන්ත මඟින්, වල් නාශක මගින් (2) භූමිකම්පා , සුනාමි
(3) සුනාමි , නිවාස ඉදිකිරීම් (4) භූමිකම්පා , දිලීර නාශක යෙදීමෙන්

(35) සමාජ සබඳතා බිඳවැටීම , පවුල් සංස්ථා බිඳ වැටීම හා සමාජ විරෝධී ක්‍රියා වැඩිවීම සිදුවන්නේ,

(1) දේශගුණික වෙනස් වීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල මගිනි.
(2) ජෛව පරිසරයට හානි පැමිණීම නිසා ඇතිවන අහිතකර ප්‍රතිඵල මගිනි.
(3) සමාජ පරිසරයට හානි පැමිණීම නිසා සිදුවන අහිතකර ප්‍රතිඵල මගිනි.
(4) කාර්මික අපද්‍රව්‍ය බැහැර කිරීමත් සිදු වන අහිතකර ප්‍රතිඵල මගිනි.

(36) සංවර්ධනය මැනීමට යොදා ගන්නා සාම්ප්‍රදායික මිනුම් ඒකකය වනුයේ,

(1) මානව පීඩන දර්ශකය (2) අන්තර්ජාල භාවිතය
(3) ආර්ථික වර්ධන වේගය (4) පරිගණක සාක්ෂරතාවය

(37) ලොව ප්‍රථම කලාපීය යුධමය සංවිධානය වනුයේ,

(1) උතුරු අත්ලාන්තික් ගිවිසුම් සංවිධානය (2) වෝර්සෝ ගිවිසුම් සංවිධානය
(3) සාර්ක් සංවිධානය (4) බිම්ස්ටෙක් සංවිධානය

(38) එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයට අයත් ස්ථාවර සාමාජික රටක් නොවනුයේ,

(1) ඇමරිකා එක්සත් ජනපදය (2) සෝවියට් රුසියාව (3) ඉන්දියාව (4) බ්‍රිතාන්‍ය

(39) දෙවන ලෝක මහා සංග්‍රාමය අවසන් වීමත් සමග ක්‍රි.ව 1945 ජුනි 26 දින ඇමරිකාවේ ෆ්‍රැන්සිස්කෝ නුවර දී ආරම්භ කළ සංවිධානය වනුයේ,

(1) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
(2) සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය
(3) එක්සත් ජාතීන්ගේ සංවිධානය
(4) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනික , විද්‍යාත්මක හා සංස්කෘතික සංවිධානය

(40) එක්සත් ජාතීන්ගේ සංවිධාන ව්‍යුහයට අයත් නොවන්නේ,

(1) මහා මණ්ඩලය (2) කැබිනට් මණ්ඩලය (3) ආරක්ෂක මණ්ඩලය (4) භාරකාර මණ්ඩලය

(ලකුණු $1 \times 40 = 40$ )

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ஊவா மாகாண கல்வித் திணைக்களம்

Uva Provincial Department of Education

**පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)**

| 11 ශ්‍රේණිය | පුරවැසි අධ්‍යාපනය II | කාලය පැය 02 යි |
|---|---|---|

## II කොටස

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

---

(01) (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

(ii) ශ්‍රී ලංකාවේ දක්නට ලැබෙන පළාත් පාලන ආයතන තුනෙන් දෙකක් නම් කරන්න.

(iii) ලොව සංකීර්ණ බහු සංස්කෘතික රාජ්‍යයන් දෙකක් නම් කරන්න.

(iv) නිෂ්පාදනය සඳහා යොදා ගන්නා ප්‍රධාන ශිල්පීය ක්‍රම දෙක නම් කරන්න.

(v) රටවල් අතර පවත්නා ගැටුම් අන්තර්ජාතික ගැටුම් ලෙස හඳුන්වයි. මෙම ගැටුම් ප්‍රධාන කොටස් දෙකකි. ඒවා නම් කරන්න

(vi) නීතිය ක්‍රියාත්මක වන ආකාරය අනුව කොටස් දෙකකට බෙදේ. එය නම් කරන්න.

(vii) සී. එන්.ස්ට්‍රෝන් මහතා දක්වන පරිදි ඒකීය ආණ්ඩුක්‍රමයක ප්‍රධාන ලක්ෂණ දෙකකි. එම ලක්ෂණ නම් කරන්න.

(viii) යුතුකම් ප්‍රධාන කොටස් දෙකකට බෙදේ.එම කොටස් දෙක නම් කරන්න.

(ix) සංවර්ධනය මැනීමට භාවිත මිනුම් උපයෝගී කරගෙන සංවර්ධිත මට්ටම් අනුව රටවල් ප්‍රධාන කොටස් දෙකකට වර්ග කර ඇත.එය නම් කරන්න.

(x) ජාත්‍යන්තර සම්බන්ධතා පවත්වනු ලබන ප්‍රධාන ස්වරූප දෙකකි.එම ස්වරූප නම් කරන්න.

***(ලකුණු 02 × 10 = 20)***

(02) (i) රාජ්‍යයන්ගේ ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න. ***(ලකුණු 02)***

(ii) ආණ්ඩුවේ ප්‍රධාන ආයතන තුන නම් කරන්න. ***(ලකුණු 03)***

(iii) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක වැදගත්කම පිළිබඳ ව කරුණු තුනක් සඳහන් කර ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. ***(ලකුණු 05)***

(03) (i) බේරුම්කරණය ප්‍රධාන කොටස් දෙකකි. එම කොටස් නම් කරන්න. ***(ලකුණු 02)***

(ii) දේශීය නීතිය ප්‍රධාන කොටස් තුනකි එම කොටස් නම් කරන්න. ***(ලකුණු 03)***

(iii) (a) ශ්‍රී ලංකාවේ අධිකරණ කටයුතු හා නීති පිළිබඳ ව ඉහළම තලයේ ඇති නිල හෙවත් භූමිකා තුනකි. ඉන් දෙකක් නම් කරන්න ***(ලකුණු 02)***

(b) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රෝම ලන්දේසි නීතිය ට අමතරව ක්‍රියාත්මක වන නීති වර්ග තුනක් නම් කරන්න. ***(ලකුණු 03)***

(04) (i) ගැටුම් වර්ග පුළුල් ලෙස ප්‍රධාන ක්ෂේත්‍ර දෙකකි.එම ක්ෂේත්‍ර නම් කරන්න. ***(ලකුණු 02)***

(ii) ගැටුම් ඇතිවන පාර්ශව තුනක් නම් කරන්න. ***(ලකුණු 03)***

(iii) (a) ගැටුම් නිරාකරණයේ දී බේරුම්කරුවෙකු සතු විය යුතු ගුණාංග දෙකක් සඳහන් කරන්න. ***(ලකුණු 02)***

(b) ගැටුම් නිරාකරණයට ඇති තවත් ක්‍රමයක් ලෙස උපදේශනය පෙන්වා දිය හැකිය. උපදේශනය යනු කුමක් ද කෙටියෙන් දක්වන්න. ***(ලකුණු 03)***

(05) (i) කාන්තාවන් සම්බන්ධයෙන් ලිච්ඡවී රජ දරුවන් අනුගමනය කළ චාරිත්‍ර ධර්ම දෙකක් නම් කරන්න. ***(ලකුණු 02)***

(ii) කම්කරු අයිතිවාසිකම් තහවුරු කර දීම සඳහා ශ්‍රී ලංකාවේ සම්මත කර ඇති අණ පනත් තුනක් නම් කරන්න. ***(ලකුණු 03)***

(iii) (a) ශ්‍රී ලංකාවේ පරිසර සංරක්ෂණය සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන ආයතන / දෙපාර්තමේන්තු දෙකක් නම් කරන්න. ***(ලකුණු 02)***

(b) ජලය දූෂණය වන ක්‍රම දෙකක් හා එය වළක්වා ගත හැකි ක්‍රමයක් යෝජනා කරන්න. ***(ලකුණු 03)***

(06) (i) වෙළඳාමේ ප්‍රධාන කොටස් දෙක නම් කරන්න. ***(ලකුණු 02)***

(ii) පරිවර්තන ආර්ථිකයන්හි දක්නට ලැබෙන ලක්ෂණ තුනක් නම් කරන්න. ***(ලකුණු 03)***

(iii) ලොව දක්නට ලැබෙන අර්ථ ක්‍රම තුන නම් කර ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. ***(ලකුණු 05)***

(07) (i) මානව සංවර්ධන දර්ශකය යටතේ මැන බැලෙන සංයුක්ත දර්ශක තුනකි.ඉන් දෙකක් නම් කරන්න. ***(ලකුණු 02)***

(ii) තිරසාර සංවර්ධනය ළඟා කර ගැනීමේ දී ජයගත යුතු ප්‍රධාන අභියෝග තුනකි.එම අභියෝග තුන නම් කරන්න. ***(ලකුණු 03)***

(iii) මෑත කාලයේ සංවර්ධිත රටවල් මුහුණ දෙන ගැටලු තුනක් නම් කර ඉන් දෙකක් කෙටියෙන් විස්තර කරන්න. ***(ලකුණු 05)***

**පෙරහුරු පරීක්ෂණය - 2021 (2022)**
**11 ශ්‍රේණිය**
**පුරවැසි අධ්‍යාපනය - I / II (පිළිතුරු පත්‍රය)**

I කොටස

| ප්‍රශ්න අංක | | ප්‍රශ්න අංක | | ප්‍රශ්න අංක | | ප්‍රශ්න අංක | |
|---|---|---|---|---|---|---|---|
| 01 | **4** | 11 | **1** | 21 | **3** | 31 | **4** |
| 02 | **2** | 12 | **1** | 22 | **1** | 32 | **1** |
| 03 | **3** | 13 | **2** | 23 | **1** | 33 | **3** |
| 04 | **2** | 14 | **2** | 24 | **3** | 34 | **2** |
| 05 | **4** | 15 | **1** | 25 | **3** | 35 | **3** |
| 06 | **1** | 16 | **4** | 26 | **2** | 36 | **3** |
| 07 | **4** | 17 | **2** | 27 | **1** | 37 | **1** |
| 08 | **3** | 18 | **3** | 28 | **2** | 38 | **3** |
| 09 | **1** | 19 | **1** | 29 | **2** | 39 | **3** |
| 10 | **4** | 20 | **4** | 30 | **2** | 40 | **2** |

II කොටස

(01) (i) * සෘජු ප්‍රජාතන්ත්‍රවාදය * වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය
(ii) * මහ නගර සභා * නගර සභා * ප්‍රාදේශීය සභා
(iii) * ඉන්දියාව * ඇමරිකාව
(iv) *ප්‍රාග්ධන සූක්ෂම ක්‍රමය * ශ්‍රම සූක්ෂම ක්‍රමය
(v) * මතවාදී ගැටුම් * යුධමය ගැටුම්
(vi) *දේශීය නීතිය * අන්තර්ජාතික නීතිය
(vii) * මධ්‍යම ආණ්ඩුවේ උත්තරීතර භාවය
* අතිරේක ස්වාධීපති ආයතන ආණ්ඩුක්‍රමය තුළ නොමැතිවීම.
(viii) * නීතිමය යුතුකම් * සදාචාරාත්මක යුතුකම්
(ix) * සංවර්ධනය වන රටවල් * සංවර්ධිත රටවල්
(x) * රාජ්‍ය උපාය සම්බන්ධතා * යුද උපාය සම්බන්ධතා

(02) (i) *ඒකීය රාජ්‍ය * සන්ධීය රාජ්‍ය
(ii) *ව්‍යවස්ථාදායකය * විධායකය * අධිකරණය
(iii) * සමාන අයිතිවාසිකම් හිමි වීම.
* පුද්ගල හැකියා හා දක්ෂතා සංවර්ධනයට ඉඩ ප්‍රස්ථාව ලැබීම.
* පුරවැසියන්ට පාලනයට සහභාගී වීමට අවස්ථාව උදාවීම.
* මානව සංවර්ධනයට ප්‍රමුඛතාව හිමිවීම.
* සාමකාමී සමාජයක් ගොඩනැගීමට පදනම වැටීම.

(03) (i) * ස්වෙච්ඡාවෙන් ඇතිකරන බේරුම්කරණය
* අනිවාර්ය බේරුම්කරණය
(ii) * ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය * අපරාධ නීතිය * සිවිල් නීතිය

(iii) (a) * අධිකරණ අමාත්‍යවරයා * අග්‍රවිනිශ්චයකාරතුමා * නීතිපති තුමා
(b) * උඩරට නීතිය * තේසවලාමේ නීතිය * මුස්ලිම් නීතිය

(04) (i) * අභ්‍යන්තර ගැටුම් * අන්තර්ජාතික ගැටුම්
(ii) * පුද්ගලයා තුළ * පුද්ගලයන් අතර
* ජන කණ්ඩායම් අතර * රටවල් අතර
(iii) (a) * හොඳින් සවන්දීම. * පක්ෂග්‍රාහී වීම.
* මධ්‍යස්ථ වීම. * නිවැරදි තීරණ ගැනීම.
* විචාරශීලී හා නිර්මාණශීලී බව * සාධාරණ බව
* යමක් අර්ථවත්ව පැහැදිලි කිරීමේ හැකියාව
(b) * පුද්ගල ගැටුම් මෙන්ම දෙපාර්ශවයක් අතර පවතින ගැටුම් වල දී තෙවන පාර්ශවයක් විසින් විවිධාකාරයෙන් පහසුකම් සපයා උපදෙස් හා මඟ පෙන්වීම් ලබා දෙමින් ගැටුම් නිරාකරණයට යොමුවීම උපදේශනයයි.

(05) (i) *අවිවාහක කුල කුමරියන් ආරක්ෂා කිරීම.
*විවාහක කුල කුමරියන් ආරක්ෂා කිරීම.
(ii) *සාප්පු හා කාර්යාල සේවක පනත
*ප්‍රසූති ආධාර ආඥා පනත
*කාර්මික ආරවුල් පනත
*පඩි පාලක සභා ආඥා පනත
* සේවක අර්ථ සාධක අරමුදල් පනත
(iii) (a) * පරිසර අමාත්‍යාංශය *වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව
* භූ විද්‍යා හා පතල් කැණීමේ කාර්යාංශය * සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
* වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව * වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
(b) * සුදුසු පිළිතුරු සඳහා ලකුණු ලබා දෙන්න.

(06) (i) * තොග වෙළඳාම * සිල්ලර වෙළඳාම
(ii) * පාඩු ලබන රාජ්‍ය ව්‍යවසායකයන් පෞද්ගලීකරණය කිරීම.
* පෞද්ගලික දේපල අයිතියට ඉඩ සලසා දීම.
* පෞද්ගලික ව්‍යවසායකයන් දිරිගැන්වීම.
* ආර්ථිකය ලිහිල්කරණය
(iii) * ධනවාදී අර්ථ ක්‍රමය * සමාජවාදී අර්ථ ක්‍රමය * මිශ්‍ර අර්ථ ක්‍රමය

(07) (i) * උපතේදී ආයු අපේක්ෂාව * අධ්‍යාපනය * ක්‍රය ශක්තිය
(ii) * සමාජීය අවශ්‍යතා * පරිසර සංවර්ධනය * ආර්ථික සංවර්ධනය
(iii) * පරිසර දූෂණය * ජාත්‍යන්තර ත්‍රස්තවාදය
* අමුද්‍රව්‍ය ලබා ගැනීමේ අපහසුව * බලශක්තිය අර්බුදය
* වෙළඳපොල තරඟය * සමාජීය ගැටලු උග්‍රවීම
* ස්වභාවික විපත් වැඩි වීම
* නව කාර්මික රටවල එල්ලවන වෙළඳපොළ තරගය


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
GUIDE
PAST PAPERS
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
G.C.E. O/L
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
HOME
DELIVERY
CASH ON DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440